# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 11 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

01. දේපල පිරියත හා උපකරණ ප්‍රමිතියට (LKAS – 16) අනුව එම අයිතමයක පිරිවැය වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා ඉටුවිය යුතු නිර්ණායක වන්නේ මින් කවර ප්‍රකාශද?
    - A. ව්‍යාපාරය විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පතක් වීම.
    - B. වත්කම වෙනුවෙන් දරණ ලද පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකි වීම.
    - C. අයිතම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ හැකියාවක් තිබීම.

    (1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) B හා C පමණි. (5) A හා C පමණි.

02. LKAS – 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතියට අනුව ප්‍රතිපාදනයක් ගිණුම්ගත කිරීමට සම්පූර්ණ විය යුතු නිර්ණායක වන්නේ, මින් කවර ප්‍රකාශද?
    - A. අතීත සිදුවීමක් මත වර්තමානයේ බැඳීමක් (නෛතික හෝ සම්මුතික) තිබිය යුතු වීම.
    - B. බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කිරීමේ හැකියාව.
    - C. මෙම බැඳීම නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යාමේ හැකියාවක් තිබිය යුතු වීම.

    (1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි
    (4) C පමණි. (5) A, B හා C පමණි.

03. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සී/ස රිටිගල සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2021.07.18 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදි. 2021.03.31 දින සිට 2021.07.18 දක්වා කාලයේ පහත දෑ සමාගමේ සිදු විය.

    - A. 2021.02.15 සිදු වූ ගින්නකින් යන්ත්‍ර වලට සිදු වූ හානිය සඳහා කර තිබූ වන්දි ඉල්ලීම 2021.06.15 දින අනුමත කිරීම.
    - B. 2021.04.25 රුපියල් 250,000 ක වෙළඳ ණයගැතියෙකු 2021.07.10 දින බංකොලොත්වීම ප්‍රකාශයට පත් කිරීම.
    - C. සමාගමේ ඇසුරුම් අංශය 2020.05.15 දින රජය මඟින් පවරා ගන්නා ලද අතර, එහි වටිනාකම මිලියන 38 කි.

LKAS – 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව ඉහත කුමන සිදුවීම / සිදුවීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල ගැළපීම් කළ යුතුද ?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A හා B පමණි. (5) A,B හා C යන සියල්ලම.

04. සී/ස පුලතිසි සමාගම රු.1,000,000 කට යන්ත්‍රයක් මිලදී ගත් අතර එහි ඵලදායී ජීව කාලය වසර 5 ක් වන අතර සුන් බුන් අගය රු.188,000 කි. සමාගම හීනවන ශේෂ ක්‍රමයට වසර 3ක් ක්ෂය කළ පසු වාර්ෂික ක්ෂය ක්‍රමය සරලමාර්ග ක්‍රමයට වෙනස් කරන ලද නම් පිළිවෙලින් හතරවන වර්ෂය ආරම්භයේ ක්ෂය කළ හැකි වටිනාකම හා පස් වන වර්ෂයේ ක්ෂය ප්‍රමාණය පිළිවෙලින්,

(1) රු. 640,000 හා රු. 128,000. (2) රු. 488,000 හා රු. 150,000.
(3) රු. 300,000 හා රු. 150,000. (4) රු. 512,000 හා රු. 244,000.
(5) රු. 640,000 හා රු. 244,000.

05. ව්‍යාපාරයක තොග පිරිවැය ආගණනය කිරීමේදී LKAS – 02 (තොග ප්‍රමිතිය) අනුව ඒ සඳහා භාවිතා කරන පිරිවැය මිණුම්කරණ ක්‍රම දෙකක් දක්වා ඇත. එම මිණුම්කරණ ක්‍රම වන්නේ,

(1) ඓතිහාසික පිරිවැය හා ප්‍රවර්තන පිරිවැය.
(2) උපලබ්ධි වටිනාකම හා ඓතිහාසික පිරිවැය.
(3) ප්‍රමිත පිරිවැය ක්‍රමය හා සිල්ලර මිල ක්‍රමය.
(4) වර්තමාන වටිනාකම හා ප්‍රවර්තන පිරිවැය.
(5) පිරිවැය වටිනාකම හා ශුද්ධ උපලබ්ධි වටිනාකම.

06. මූල්‍ය වාර්තාකරණ සඳහා සංකල්පනාත්මක රාමුවට අනුව ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණ ප්‍රධාන වශයෙන් ආකාර දෙකක් යටතේ දක්වනු ලබයි. ඉන් එක් ලක්ෂණයක් වන්නේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ගති ලක්ෂණයයි. මෙම ගති ලක්ෂණවල පොදු අනුගති ලක්ෂණය වන්නේ,

(1) සම්පූර්ණත්වය. (2) සංසන්දනාත්මක භාවය. (3) අවබෝධ කර ගත හැකි බව.
(4) ඒකාකාරීභාවය. (5) මධ්‍යස්ථභාවය.

07. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ කාර්යභාරයට අදාල කටයුතු දක්වන්න.

(1)
(2)
(3)
(4)

08. භාවිත අයිතිය සහිතව මෝටර් රථයක් ලබා ගැනීම සඳහා සී/ස වෙල්ලස්ස සමාගම 2021.04.01 දින කල්බදු ගිවිසුමකට එළඹෙන ලදි. මෙහි මූලික ගිණුම්කරණ වටිනාකම රු. 4,724,500 ක් විය. කල්බදු ගිවිසුමට අනුව වාර්ෂික කල්බදු වාරිකය රු. 900,000 ක් වන අතර එය 2022.03.31 දින ගෙවිය යුතුය. එසේම 2023.03.31 හා 2024.03.31 දිනවල ගෙවනු ලබන වාරිකවල පිළිවෙලින් පොලී වටිනාකම වූයේ රු. 368,000 හා 312,000 ක් වේ.එසේම කල්බදු කාලය අවසානයේ මෝටර් රථය වෙල්ලස්ස සමාගමට හිමිවන අතර මෙම මෝටර් රථයේ ඵලදායී ජීව කාලය වසර 5ක් වන අතර කල්බදු කාලය වසර 4ක් වන අතරම සුන්බුන් අගය රු. 524,500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

SLFRS – 16 (කල්බදු) ප්‍රමිතියට අනුව 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හා ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්වෙන අගයන් වන්නේ,

(1) ජංගම වගකීම් ..........................................

(2) ජංගම නොවන වගකීම් ................................................

(3) ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ක්ෂය වටිනාකම ..................................................

09. SLFRS – 15 (අයභාර පිළිබඳ) ප්‍රමිතියට අනුව අයභාරය හඳුනාගැනීමට පියවර 5ක් අදාල වේ. ඒ සඳහා අදාල වන පියවරයන් ලෙස දක්වා ඇති කරුණු සත්‍ය ද ( T ) අසත්‍ය ද ( F ) යන්න දක්වන්න.

| | පියවරයන් | සත්‍ය / අසත්‍ය |
|---|---|---|
| (1) | ගණුදෙනුකරු සමඟ ඇතිවන ගිවිසුම හඳුනා ගැනීම. | ..................... |
| (2) | ගිවිසුමට සම්බන්ධ වන පාර්ශවයන් විසින් ගිවිසුම හඳුනා ගැනීම. | ..................... |
| (3) | ගණුදෙනුවේ මිල කාර්ය සාධන බැඳීම් වලට බෙදා වෙන් කිරීම. | ..................... |
| (4) | කාර්ය සාධන බැඳීම් සම්පූර්ණ කළ පසු ආදායම් හඳුනා ගැනීම. | .................... |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව